## දුම්කොළ බලපත්‍ර ලබා දීම

දැන් වික්ටෝරියාවේ දුම්කොළ නිෂ්පාදන අලෙවියට අදාළව දැඩි නව පාලනයන් සහ දඬුවම් ක්‍රියාත්මක වේ.

ඔබ වික්ටෝරියාවේ මහජනතාවට හෝ වෙනත් ව්‍යාපාරවලටදුම්කොළ විකුණන්නේ නම් ඔබට දුම්කොළ බලපත්‍රයක් තිබිය යුතුය.

මෙය සිල්ලර සහ තොග විකුණුම් යන දෙකටම අදාළ වන අතර අන්තර්ජාලය හරහා අලෙවි කරන ව්‍යාපාරද මෙයට ඇතුළත් වේ.

## දුම්කොළ බලපත්‍රයක් සඳහා අයදුම් කරන්න

ඔබට **Service Victoria** හරහා Tobacco Licensing Victoria (TLV) වෙතින් ඔබේ බලපත්‍රය සඳහා මාර්ගගතව අයදුම් කළ හැකිය.

ඔබ ඉදිරිපත් කරන අයදුම්පත්‍ර වර්ගය ඔබේ ව්‍යාපාර ව්‍යුහයට ගැලපෙන බවට ඔබ සහතික විය යුතුය. තනි වෙළෙන්දන් ස්වභාවික පුද්ගලයෙකු ලෙස අයදුම් කළ යුතු අතර, ව්‍යාපාර හවුල්කාරිත්වයක සිටින අය හවුල්කාරිත්වයක් ලෙස අයදුම් කළ යුතු අතර, රජයේ හෝ පෞද්ගලික සමාගම් සහ සංස්ථාපිත ආයතනයන් සංස්ථාගත කායයක් ලෙස අයදුම් කළ යුතුය. ඔබ ඉදිරිපත් කළ යුත්තේ කුමන වර්ගයේ අයදුම්පතක් දැයි ඔබට විශ්වාස නැත්නම්, ඔබ ස්වාධීන නීති උපදෙස් ලබා ගත යුතුය.

### අයදුම් කළ හැක්කේ කාටද

ඔබට පහත සඳහන් තත්වයන් අදාළ නම් දුම්කොළ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කළ හැකිය:

- වයස අවුරුදු 18 හෝ ඊට වැඩි තනි පුද්ගල අලෙවිකරුවෙක්
- හවුල්කාරිත්වයක්
- සමාගමක්
- සංස්ථාපිත සංගමයක්.

*1987 දුම්කොළ පනත* යටතේ, ඔබ හෝ ඔබේ ව්‍යාපාරයේ ඕනෑම අධ්‍යක්ෂවරයෙකු, විධායක කමිටු සාමාජිකයකු හෝ හවුල්කරුවන් නුසුදුසු බවට තීරණය වන්නේ නම් ඔබට අයදුම් කළ නොහැක.

### බලපත්‍ර වර්ග

දුම්කොළ බලපත්‍ර වර්ග 2 ක් ඇත: සිල්ලර සහ තොග.

ඔබ සිල්ලර **සහ** තොග යන දෙයාකාරයට ම දුම්කොළ විකුණන්නේ නම්, ඔබට බලපත්‍ර වර්ග දෙකම අවශ්‍ය වනු ඇත.

ඔබ දුම්කොළ අලෙවි කරන සෑම ස්ථානයක් සඳහාම ඔබට වෙන වෙන ම බලපත්‍ර අවශ්‍ය වේ. ඔබට එක් මාර්ගගත අයදුම්පතකට ස්ථාන කිහිපයක් ඇතුළත් කළ හැකිය.

### සිල්ලර බලපත්‍රය

විකුණුම් යන්ත්‍ර ඇතුළුව මහජනතාවට දුම්කොළ අලෙවි කරන ව්‍යාපාර සඳහා සිල්ලර බලපත්‍ර පවතියි. මෙයට ඇතුළත් වන්නේ:

- සුපිරි වෙළඳසැල්
- ග්‍රොසරි වෙළඳසැල්
- සමාන්‍ය වෙළඳසැල්
- මත්පැන් බලපත්‍ර සහිත පරිශ්‍ර

- ඉන්ධන පිරවුම්හල්
- දුම්කොළ අලෙවිකරුවන්
- අන්තර්ජාල ඔස්සේ කටයුතු කරන සිල්ලර වෙළෙන්දන්.

### තොග බලපත්‍ර

වෙනත් සිල්ලර හෝ තොග ව්‍යාපාරවලට දුම්කොළ අලෙවි කරන ව්‍යාපාර සඳහා තොග බලපත්‍ර පවතියි.

### අයදුම් කිරීමට පෙර ඔබ කළ යුතු දේ

ඔබ ඔබේ අයදුම්පත ආරම්භ කිරීමට පෙර, ඔබේ ව්‍යාපාර ව්‍යුහය දැන ගැනීමට අවශ්‍ය වනු ඇත (උදාහරණයක් ලෙස, ඔබ තනි වෙළෙන්දෙකු, හවුල්කාරිත්වයක්, සමාගමක් හෝ සංස්ථාපිත සංගමයක් ලෙස බලපත්‍රයක් සඳහා අයදුම් කරන්නේද යන්න).

**සියලුම අයදුම්කරුවන්** පහත සඳහන් දෑ ඇතුළුව ව්‍යාපාරික සහ පුද්ගලික තොරතුරු සැපයිය යුතුය:

- ව්‍යාපාරය පිහිටි ස්ථානය
- ව්‍යාපාරයේ වගර්ය
- ඔවුන් විකුණන නිෂ්පාදන
- ව්‍යාපාරයට අදාළ ඕනෑම වෙබ් අඩවියක් හෝ සමාජ මාධ්‍ය ගිණුම්.

**තනි පුද්ගල අලෙවිකරු අයදුම්කරුවන්, හවුල්කරුවන්, අධ්‍යක්ෂවරුන් සහ විධායක කමිටු සාමාජිකයින් විසින් පහත සඳහන් කරුණු** සැපිරිය යුතුය:

- තමාගේ අනන්‍යතාවය තහවුරු කිරීම
- මෑත කාලීන ජාතික පොලිස් පරීක්ෂාවක් ලබා දීම
- ඔවුන්ගේ අධ්‍යක්ෂ හැඳුනුම්පත ලබා දීම (අදාළ නම්)
- ඔවුන්ගේ පෞද්ගලික, මූල්‍ය සහ අපරාධ ඉතිහාසය සහ බංකොලොත්භාවය පිළිබඳ ඉතිහාසය හෙළි කිරීම.

**සමාගම්** විසින් ඓතිහාසික හා වත්මන් ඔස්ට්‍රේලියානු සුරකුම්පත් සහ ආයෝජන කොමිසමේ (ASIC) උපුටා ගැනීමක් සැපයිය යුතුය.

සංස්ථාපිත සංගමයක් වැනි අනෙකුත් **සංස්ථාපිත ආයතන**, සංස්ථාගත කිරීම පිළිබඳ සාක්ෂි සැපයිය යුතුය.

භාරයක් ලෙස ක්‍රියාත්මක වන **ව්‍යාපාර** භාර ඔප්පුවක් ලබා දිය යුතුය.

### බලපත්‍ර අයදුම්පත් ගාස්තු

ඔබ අයදුම් කරන විට ගාස්තුවක් ගෙවිය යුතුය. ඔබට වීසා, මාස්ටර් කාඩ් හෝ BPay මගින් ගෙවිය හැකිය. ඔබගේ අයදුම්පත ප්‍රතික්ෂේප කළත්, ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

| අයදුම්පත් වගර්ය | ගාස්තුව |
| --- | --- |
| 2026 ජූනි 30 දිනට පෙර ලබා දී ඇති බලපත්‍ර අයදුම්පත්, 2027 ජූනි 30 දක්වා වලංගුය. | $1,175.20 |
| 2026 ජූනි 30 න් පසු වාෂර්ික බලපත්‍රය සඳහා අයදුම්පත ලබා දෙනු ඇත. | $829.60 |

### ඔබ අයදුම් කළ පසු

ඔබගේ අයදුම්පත සහ ගෙවීම අපට ලැබුණු පසු, ඔබ දුම්කොළ බලපත්‍රයක් ලබා ගැනීමට සුදුසු දැයි තීරණය කිරීම සඳහා අපි එය සමාලෝචනය කරන්නෙමු.

එක් එක් අයදුම්පත් සඳහා සැකසුම් කාලය වෙනස් වේ. බලපත්‍ර අයදුම්පතක් ඉදිරිපත් කිරීම මගින් පමණක් ඔබට බලපත්‍රයක් ලබා දෙන බවට සහතිකයක් නොලැබේ.

ඔබගේ අයදුම්පත්‍රයේ ප්‍රතිඵලය අපි ඊමේල් පණිවුඩයක් ඔස්සේ ඔබට දන්වන්නෙමු.

## ඔබගේ අයදුම්පත අනුමත වුවහොත්

ඔබගේ අයදුම්පත අනුමත වුවහොත්, ඔබ සිය වගකීම් අවබෝධ කරගෙන ඔබේ දුම්කොළ බලපත්‍රයේ කොන්දේසි අනුගමනය කළ යුතුය.

## ඔබගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්

අපගේ තීරණයට ඔබ එකඟ නොවන්නේ නම්, TLV වෙබ් අඩවියෙන් ලබා ගත හැකි අභ්‍යන්තර සමාලෝචන පෝරමයක් සඳහා අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් ඔබට අභ්‍යන්තර සමාලෝචනයක් ඉල්ලා සිටිය හැකිය.

අපි දින 28ක් ඇතුළත තීරණය සමාලෝචනය සිදු කර ඔබට ප්‍රතිඵලය දන්වන්නෙමු.

අභ්‍යන්තර සමාලෝචනයේ ප්‍රතිඵලය ගැන ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, ඔබට වික්ටෝරියානු සිවිල් සහ පරිපාලන විනිශ්චය සභාවට (VCAT) අයදුම් කළ හැකිය.

අභ්‍යන්තර සමාලෝචන තීරණය ලැබී දින 28ක් ඇතුළත ඔබ විසින් අයදුම් කළ යුතුය.

## ඔබේ දුම්කොළ බලපත්‍රය අලුත් කිරීම

දුම්කොළ බලපත්‍ර මූල්‍ය වර්ෂයක් සඳහා වලංගු වේ. බලපත්‍ර සෑම වසරකම ජුනි 30 දිනෙන් කල් ඉකුත් වේ.

ඔබ සෑම වසරකම ජුනි 30 වන දිනට පෙර ඔබේ බලපත්‍රය අලුත් කිරීමට අයදුම් කළ යුතුය.

ඔබගේ බලපත්‍රය කල් ඉකුත් වීමට පෙර ඔබගේ අලුත් කිරීමේ අයදුම්පත පිළිබඳව අපි තීරණයක් ගෙන නැත්නම් නම්, තීරණය ගන්නා තෙක් ඔබගේ බලපත්‍රය වලංගු වනු ඇත.

පහත දැක්වෙන කරුණුවලට ඔබට TLV වෙතින් අනුමැතිය අවශ්‍ය වනු ඇත:

- ඔබේ බලපත්‍රයේ කොන්දේසි වෙනස් කිරීමට
- ඔබගේ බලපත්‍රය මාරු කිරීමට (උදා: නව හිමිකරුවෙකුට)
- ඔබේ බලපත්‍රය වෙනත් ස්ථානයකට ගෙන යෑම (උදා: ව්‍යාපාර ස්ථානය වෙනස් කිරීම)
- ඔබගේ බලපත්‍රය අවලංගු කිරීම හෝ අත්හිටුවීම.

මෙම වෙනස්කම් කිසිවක් සිදු කිරීමට ඔබට අවශ්‍ය නම්, ඔබ TLV වෙබ් අඩවියේ සුදුසු පෝරමය භාවිතා කර අයදුම් කර අදාළ ගාස්තුව ගෙවිය යුතුය.

2025-26 මූල්‍ය වර්ෂය තුළ නිකුත් කරන ලද බලපත්‍ර 2027 ජුනි 30 දක්වා වලංගු වේ.

## ඔබේ දුම්කොළ බලපත්‍රයේ නීති රීති අනුගමනය කරන්න.

ඔබේ බැඳීම් සහ ඔබේ දුම්කොළ බලපත්‍රයේ කොන්දේසි ඔබ දැන සිටිය යුතුය.

ඔබේ ව්‍යාපාරය විවෘතව පවතින විට ගනුදෙනුකරුවන්ට පහසුවෙන් කියවිය හැකි වන පරිදි ඔබේ බලපත්‍රය ප්‍රදර්ශනය කරන්න.

ඔබගේ බලපත්‍රය මත පනවා ඇති ඕනෑම කොන්දේසියකට ඔබ අනුකූල විය යුතුය.

සියලුම බලපත්‍ර සඳහා සම්මත කොන්දේසි පවතියි. සියලුම බලපත්‍ර සඳහා සම්මත කොන්දේසි 2017 දුම්කොළ රෙගුලාසි වල දක්වා ඇත. මේවා නම්:

- බලපත්‍රලාභීන් දුම්කොළ සැපයීම සහ මිලදී ගැනීම කළ යුත්තේ වෙනත් බලපත්‍රලාභී ව්‍යාපාරවලින් පමණි (විකිණීම ඔස්ට්‍රේලියාව තුළ සිදුවන්නේ නම්).
- බලපත්‍රලාභීන් දුම්කොළ මිලදී ගැනීම් පිළිබඳ වාර්තා (ඔස්ට්‍රේලියාව තුළ සහ විදේශයන්හි) තබා ගත යුතු අතර ඉල්ලා සිටියහොත් ඒවා TLV වෙත ලබා දිය යුතුය.

- බලපත්‍රලාභීන් සෑම ස්ථානයකම දුම්කොළ අලෙවිය පිළිබඳ දත්ත රැස් කර වාෂිකව TLV වෙත වාර්තා කළ යුතුය.
- 2027 ජනවාරි 1 වන දින සිට, සිල්ලර බලපත්‍රලාභීන් වයස අවුරුදු 18 ට අඩු සේවකයින්ට දුම්කොළ නිෂ්පාදන විකිණීමට ඉඩ නොදිය යුතුය.

### නිශ්චිත කොන්දේසි

බලපත්‍රවල අවදානම් අඩු කිරීම සඳහා කොන්දේසි ඇතුළත් විය හැකිය. මේවාට මෙහෙයුම් වේලාවන් අඩු කිරීම හෝ ඇතැම් නිෂ්පාදන ප්‍රදශර්නය සීමා කිරීම ඇතුළත් විය හැකිය.

අප විසින් නව බලපත්‍රයක් ලබා දෙන විට හෝ මාරු කරන විට, නැවත ස්ථානගත කරන විට හෝ විචලන අයදුම්පතක කොටසක් ලෙස මෙය සිදුවිය හැකිය.

### ඔබේ තොරතුරු යාවත්කාලීනව තබා ගන්න

ඔබගේ අයදුම්පතෙහි ඔබ සපයා ඇති තොරතුරු වලට පහත සඳහන් වෙනස්කම් සිදුවුවහොත්, එම **වෙනස්කම් සිදුවී දින 14ක් ඇතුළත** ඒ බව අපට දැනුම් දිය යුතුය:

- නව සම්බන්ධතා තොරතුරු වැනි බලපත්‍රලාභියාගේ විස්තර
- අධ්‍යක්ෂවරුන්, විධායක කමිටු සාමාජිකයින් හෝ හවුල්කරුවන් වැනි ඔබේ ව්‍යාපාරය කළමනාකරණය කිරීමට සම්බන්ධ පුද්ගලයින්ට සිදුවන වෙනස්කම්
- නව ඉඩම් හිමියෙකු හෝ දේපළ වෙළඳාම් නියෝජිතයෙකු වැනි පරිශ්‍ර විස්තර
- ඔබේ ව්‍යාපාරයට බලපෑම් කළ හැකි හෝ ඒ කෙරෙහි මූල්‍යමය උනන්දුවක් ඇති පුද්ගලයින් සම්බන්ධයෙන් සිදුවන වෙනස්කම්, උදා: ව්‍යාපාරය සඳහා සේවය කරන පවුලේ සාමාජිකයන් හෝ මුදල් ණයට දුන් පුද්ගලයින්
- ලේඛන යාවත්කාලීන කිරීම්.

### දුම්කොළ බලපත්‍ර අනුකූලතාවය සහ බලාත්මක කිරීම

TLV විසින් 2026 පෙබරවාරි 1 වන දින සිට බලපත්‍ර යෝජනා ක්‍රමය බලාත්මක කිරීමට පටන් ගනු ඇත. මෙම දිනය වන විට දුම්කොළ අලෙවි කරන ව්‍යාපාරවලට බලපත්‍රයක් තිබිය යුතුය.

දුම්කොළ අලෙවි කරන ව්‍යාපාරවලට බලපත්‍රයක් තිබේද සහ ඒවා ඔවුන්ගේ බලපත්‍ර කොන්දේසිවලට අනුකූලද යන්න අපි පරීක්ෂා කරන්නෙමු.

**ඔබ නීතියට අනුකූල නොවන්නේ නම්, අපට ඔබේ බලපත්‍රය වෙනස් කිරීමට, අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට හැකිය.**

ඔබ නීති විරෝධී දුම්කොළ ළඟ තබාගෙන සිටින බවට හෝ අලෙවි කරන බවට අපට සැකයක් ඇත්නම්, අපට ඔබගේ බලපත්‍රය දින 90ක් දක්වා වහාම අත්හිටුවිය හැකිය.

අපට ඕනෑම අවස්ථාවක බලපත්‍රයක් සමාලෝචනය කළ හැකිය.

## දඬුවම්

| වරදකි | පුද්ගලයන් සඳහා දඬුවම් | ව්‍යාපාර සහ සංස්ථාපිත සංගම් සඳහා දඬුවම් |
|---|---|---|
| දුම්කොළ සැපයුම් ව්‍යාපාර මගින් නීති විරෝධී දුම්කොළ තබා ගැනීම | ඩොලර් 170,948.40 දක්වා හෝ වසර 5ක් දක්වා සිර දඬුවම්. | ඩොලර් 854,742 ට වැඩි |
| නීති විරෝධී දුම්කොළ විකිණීම | ඩොලර් 366,318 දක්වා දඩයක් හෝ වසර 15 ක් දක්වා සිර දඬුවම්. | ඩොලර් මිලියන 1.8කට වඩා |
| බලපත්‍රයක් නොමැතිව දුම්කොළ විකිණීම | ඩොලර් 170,948.40 දක්වා දඩයක් හෝ වසර 5 ක සිර දඬුවමක්. | $854,742 |

| වරදක් | පුද්ගලයන් සඳහා දඩුවම් | ව්‍යාපාර සහ සංස්ථාපිත සංගම් සඳහා දඩුවම් |
|---|---|---|
| බලපත්‍ර කොන්දේසි හෝ බැඳීම්වලට අනුකූල වීමට අපොහොසත් වීම | $12,210.60 දක්වා | $61,053 |
| ව්‍යාජ හෝ නොමග යවන සුලු තොරතුරු සැපයීම | $12,210.60 දක්වා | $61,053 |
| බලපත්‍රයේ පිටපතක් ප්‍රදර්ශනය කිරීමට අපොහොසත් වීම | $1,017.55 දක්වා | $5,087.75 |

## Tobacco Licensing Victoria ගැන

වික්ටෝරියා ප්‍රාන්තයේ දුම්කොළ නිෂ්පාදන නීත්‍යානුකූලව සැපයීමTobacco Licensing Victoria  (TLV) මගින් නියාමනය කරනු ලැබේ.

අපි අධිකරණ හා ප්‍රජා ආරක්ෂණ දෙපාතර්මේන්තුවේ කොටසක් වන අතර පහත සඳහන් දේ සඳහා වගකිව යුතු වන්නෙමු:

- දුම්කොළ නිෂ්පාදන සපයන ව්‍යාපාර සඳහා බලපත්‍ර ලබා දීම
- බලපත්‍ර යෝජනා ක්‍රමය විමශර්නය කිරීම සහ බලාත්මක කිරීම.

බලපත්‍ර ක්‍රමය මගින් මිනිස් පරිභෝජනය සඳහා නිමර්ාණය කර ඇති සිගරට්, සුරුට්ටු සහ අනෙකුත් දුම්කොළ නිෂ්පාදන අලෙවිය නියාමනය කරනු ලැබේ.

මෙම යෝජනා ක්‍රමය යටතේ විද්‍යුත් සිගරට් සහ වාෂ්ප (වේප්) නියාමනය නොකෙරේ. මෙම නිෂ්පාදන පොදුරාජ්‍ය මණ්ඩලීය රජය විසින් නියාමනය කරනු ලැබේ.

## TLV අමතන්න

ඊමේල්: contacttobacco@justice.vic.gov.au

අමතන්න: 1300 194 739